සුවිශේෂ වාක්‍යය එසේය.

# පාස්කු සතියේ
# බදාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා **3 : 1-10**

**ජේසුස් ස්වාමීන් වහන්සේගේ නාමයෙන් නැඟිට ඇවිදින්න.**

දිනක් පේදුරු සහ ජුවාම් යාච්ඤා වේලාව වූ සවස තුනට දේව මාළිගයට ගියහ. එවිට උපන් දා පටන් තොරව සිටි එක්තරා මිනිසෙක් විය. දේව මාළිගයට ඇතුළු වන්නන්ගෙන් සිගමන් ඉල්ලන පිණිස, දේව මාළිගාවේ 'සුදර්ශන' නම් ලත් දොරටුව ළඟ දිනපතා ඔහු තබන ලදි. ඔහු පේදුරු සහ ජුවාම් දේව මාළිගාවට ඇතුළු වන්නට යන බව දැක සිගමන් ඉල්ලීය. පේදුරු ජුවාම් සමඟ ඔහු දෙස නෙත් යොමා 'අප දෙස බලන්නැ'යි කීය. ඔහු ද ඔවුන්ගෙන් යමක් ලබන බලාපොරොත්තුවෙන් ඔවුන් දෙස ඕනෑකමින් බැලීය. එවිට පේදුරු 'රන් වත් රිදී වත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි. නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්නැ''යි කීය. එසේ කියා පේදුරු තුමා ඔහුගේ දකුණත අල්ලා ඔහු නැගිටුවාලී ය. එකෙණෙහිම ඔහුගේ පාද සහ වළලුකර ශක්තිසම්පන්න විය. ඔහු උඩ පැන කෙළින් සිට ඇවිදින්නට විය. තවද, ඇවිදිමින් ද, උඩ පනිමින් ද දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් ද ඔහු ඔවුන් සමඟ දේව මාළිගාවට ඇතුළු විය. ඔහු ඇවිදිනවාත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරනවාත් සියලු දෙනා දුටුවෝ ය. දේව මාළිගාවේ 'සුදර්ශන' දොරටුව ළඟ හිඳගෙන සිගමන් ඉල්ලුවේ මේ මිනිසා බව හඳුනාගත් ඔව්හු ඔහුට සිදු වූ දේ ගැන පුදුමයෙන් පුදුමයට පත් වූහ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 105 : 1-9

පිළිතුර: සමිඳාණන් සොයන්නන්ගේ සිත් ප්‍රීති ප්‍රමුදිත වේවා! ආලේලූයා //

ගීය:

සමිඳුන්ට තුති පුදන්න. එතුමන්ගේ නාමයෙන් අයදින්න. ජාතීන් අතරේ එතුමන්ගේ ක්‍රියා පළ කරන්න.
එතුමන්ට ගී ගයන්න. එතුමන්ට පසස් ගී ගයන්න.
එතුමන්ගේ පුදුම ක්‍රියා මෙනෙහි කරන්න.

එතුමන්ගේ ශුද්ධනාමය ගැන උදන් අනන්න. සමිඳාණන් සොයන්නන්ගේ සිත් ප්‍රීති ප්‍රමුදිත වේවා!
සමිඳාණන් ද එතුමන්ගේ බලය ද සොයා බලන්න. එතුමාණන් හමුව නිතරම සොයන්න.

එතුමන්ගේ මෙහෙකරුවන් වූ ඉශ්රායෙල් වංශයෙනි, එතුමන් තෝරාගත් ජාකොබ්ගේ දරුවෙනි, එතුමන් කළ පුදුම ක්‍රියා ද එතුමන්ගේ ආශ්චර්යයන් ද එතුමන් දුන් විනිශ්චයයන් ද සිහි කරන්න.
එතුමාණෝ අපේ දෙවි සමිඳාණෝ ය. එතුමන්ගේ විනිසය මුළු පොළොවෙහි ය.

එතුමන්ගේ ගිවිසුම සදහට ම සිහි කරන්න. පරම්පරා දහසක් දක්වා එතුමන්ගේ අණ පණත් සිහි කරන්න. ඒ ගිවිසුම එතුමාණෝ ආබ්‍රහම් සමග කළ සේක. ඊසාක් ට ද දිවුරුම් දුන් සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!

මෙන්න සමිඳුන්ගේ ජය මංගල දිනය! මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.

ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 24 : 13–35

**පූපය කඩන විට ඔව්හු උත්ථාන වූ ස්වාමින් වහන්සේ හැඳින ගත්හ.**

එම දවසෙහි ගෝල සමූහයාගෙන් දෙදෙනෙක් ජෙරුසලමේ සිට කිලෝමීටර එකොළහක් පමණ දු වූ එම්මාවුස් නම් ගමට යමින් සිටියහ. එසේ යද්දී ඔව්හු සිදු වූ සියල්ල ගැන කතා කරමින් ගියහ. තවද ඔවුන් සාකච්ඡා කරමින් යද්දී ජේසුස් වහන්සේම ඔවුන් සමීපයට වැඩ ඔවුන් හා සමග ගමන් ගත් සේක. ඔවුන් උන් වහන්සේ දුටු නමුත් ඔවුන්ට උන් වහන්සේ හඳුනාගත නොහැකි විය. උන් වහන්සේ ඔවුන්ට කතා කොට "මේ ඔබ තර්ක කරමින් යන්නේ කුමන කාරණා ගැන දැ"යි ඇසූ සේක. ඔව්හු දුක්මුසු මුහුණින් යුක්තව නතර වූහ. ඔවුන්ගෙන් ක්ලේයෝපාස් නම් තැනැත්තා උත්තර දෙමින් "මේ දවස්වල ජෙරුසලමෙහි සිදු වූ කාරණා නොදැන සිටින අමුත්තා ඔබ පමණක් දැ"යි උන් වහන්සේට කීය. "කවර කාරණා දැ"යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. ඔව්හු උත්තර දෙමින් "නාසරෙත්හි ජේසුස් වහන්සේ පිළිබඳ කාරණා ය. උන්වහන්සේ දෙවියන් වහන්සේ හා සකල ජනතාව ඉදිරියෙහි ක්‍රියාවෙහි ද කතාවෙහි ද බලසම්පන්න දිවැසිවරයෙකුව සිටි සේක. නායක පූජකවරු ද අපගේ ප්‍රධානීහු ද උන් වහන්සේ මරණයට නියම කොට කුරුසියෙහි ඇණ ගැසූහ. එහෙත් ඉශ්රායෙල් මුදාලීමට සිටි එකම තැනැත් වහන්සේ උන් වහන්සේ ය යනු අපගේ බලාපොරොත්තුව විය. එපමණක් නොවේ මේ දේ සිදුවී අදට තුන් දවසක් ගත වී ඇත. තවද අපේ කණ්ඩායමේ ඇතැම් ස්ත්‍රීහු

අද හිමිදිරි උදයේ සොහොන් ගෙය ළඟට ගොස් උන් වහන්සේගේ සිරුර නොදැක අවුත් ඔවුන්ට දර්ශනය වූ දේව දූතයන් "උන් වහන්සේ ජීවමානව සිටින සේකැ"යි පැවසූ බව කියා අප විස්මිත කළහ. අප හා සමග සිටි අයගෙන් සමහරෙක් සොහොන් ගෙය ළඟට ගොස් ඒ ස්ත්‍රීන් කී ලෙසම දුටුවෝ ය. එහෙත් ඔව්හු "උන් වහන්සේ නුදුටුවෝ ය"යි කීහ. එවිට උන් වහන්සේ ඔවුන් අමතා "බුද්ධිහීන වූ ද දිවැසිවරයන් පැවසූ සියල්ල ඇදහීමට මැලි වූ ද තැනැත්තෙනි. ක්‍රිස්තුස් වහන්සේ ඒ දුක් විඳ ඉක්බිති ස්වකීය තේජශ්‍රීයට පැමිනිය යුතුව තිබුණා නොවේ ද" කියා, මෝසෙස් හා සියලු දිවැසිවරයන්ගෙන් පටන් ගෙන මුළු ශුද්ධ ලියැවිල්ලෙහි තමන් ගැන සඳහන් කරුණු ඔවුන්ට පහදා දුන් සේක.

ඔව්හු යමින් සිටි ගමට ළං වූහ. එහෙත් උන් වහන්සේ තවත් දුර යන බවක් දැක්වූ සේක. එවිට ඔව්හු "දවස ගෙවී සවස් වෙමින් එන බැවින් අප සමග නතර වුව මැනැවැ"යි උන් වහන්සේට පෙරැත්ත කළහ. උන් වහන්සේ ඔවුන් සමග නතර වීමට ගෙට ඇතුළු වූ සේක. තවද උන් වහන්සේ ඔවුන් හා සමග කෑමට හිඳගත් කල්හි පූප ගෙන ආශිර්වාදය පවසා කඩා ඔවුන්ට දුන් සේක. එවිට ඔවුන්ගේ ඇස් ඇරී ඔව්හු උන් වහන්සේ කවරෙක්දැ යි හැඳින ගත්හ. එවිට උන් වහන්සේ ඔවුන් කෙරෙන් අතුරුදහන් වූ සේක. එකල ඔව්හු "උන් වහන්සේ අප හා සමග මඟ දී කතා කරද්දීත් ශුද්ධ ලියවිල්ල පහදා දෙද්දීත් අපේ හදවත දැවී ඇවිළී ගියා නොවේ දැ" යි එකිනෙකාට කීහ. ඔව්හු ඒ වේලේ ම නැගිට ජෙරුසලමට පෙරළා ගොස් එකොළොස් දෙනා ද ඔවුන් සමග සිටි අනෙක් අය ද "ඒකාන්තයෙන්ම ස්වාමීන් වහන්සේ නැගිට සිටින සේක. සීමොන්ට ද පෙනුණු සේකැ"යි කියමින් සිටිනු දුටහ. එවිට ඔව්හු ද මඟදී තමන්ට සිදු වූ කාරණා සහ පූප කැඩීමෙහි දී ඔවුන්ට උන් වහන්සේ ප්‍රකාශ වූ සැටි ද පැවසූහ.

සුවිශේෂ වාක්‍යය එසේය.